Learning Resource Center
R
De Mazenod College
Kandana

# සන්නිවේදනය සහ මාධ්‍ය අධ්‍යයනය

## 2018 අප්‍රේල් වාර් පරීක්ෂණය

13 ශ්‍රේණිය | II පත්‍රය | කාලය පැය 3

6-04-2018

❖ ප්‍රශ්න 5 ට පිළිතුරු ලියන්න.

01. 1. සන්නිවේදන සංකල්ප හතරක් නම් කර ඉන් දෙකක, ලක්‍ෂණ 2 බැගින් කෙටියෙන් විස්තර කරන්න.

2. සත්ව සන්නිවේදනයේ දී සහ මානව සන්නිවේදනයේ වෙනස්කම් 3ක් කෙටියෙන් පැහැදිලි කරන්න.

3. ''අව්ධිමත් සන්නිවේදනයේදී අකේතිකරණය හා විකේතිකරණය අසාර්ථක විය හැකිය.'' ඉහත ප්‍රකාශයට ඔබේ අදහස් දක්වන්න.

4. ලිඛිත සන්නිවේදනයේ ඇති වාසි 4ක් විස්තර කරන්න.

02. 1. සමූහයක් තවත් සමූහයකින් වෙනස් අයුරු විශේෂතා හතරක් යටතේ කෙටියෙන් උදාහරණ ද සහිතව විස්තර කරන්න.

2. සමූහයක පැවැත්මට 'සම්මුඛ සාකච්ඡාව' මඟින් සිදුවන වාසි සහගත තත්වයන් 3 ක් විස්තර කරන්න.

3. පුද්ගලයාට සන්නිවේදනයේ ඇති අවශ්‍යතාවය කරුණු 3ක් ගෙන රචනයක් ලියන්න.

4. පුරවැසි මාධ්‍යසේසහ විකල්ප මාධ්‍යයේ 'සන්නිවේදකයා' ස්වරූපය එකිනෙකට වෙනස් වීමට බලපාන සාධක 3ක් ඉදිරිපත් කරන්න.

03. ජනමාධ්‍ය කර්මාන්තය මෙහෙයවනු ලබන්නේ දේශපාලන හා ව්‍යාපාරික කණ්ඩායම් මඟිනි.

1. ජන මාධ්‍ය ව්‍යාප්තිය මඟින් නිර්මාණය වූ ලෝකය පිළිබඳ සංකල්පය නම් කරන්න.

2. ජනමාධ්‍ය මඟින් පුද්ගලයාගේ දෛනික න්‍යාය පත්‍රය ගොඩනැංවෙන ආකාරය කරුණු 3ක් ඇසුරෙන් විස්තර කරන්න.

3. 'දැනුම් සමාජය' මඟින් සමාජය තුල පිරිසක් වෙන් වීමකට ලක්විය හැක. හේතු 3 ක් ඇසුරින් කෙටි විස්තර සපයන්න.

4. සදාචාරාත්මක විචාර ප්‍රවේශය හා දේශපාලනය විචාර ප්‍රවේය දෙක සුදුසු උදාහරණ විස්තර කරන්න.

04 1. කථනයේ හා භාෂණයේ වෙනස් කම් 4ක් ප්‍රකාශ කරන්න.

2. උපභාෂාවක් හා ප්‍රධාන භාෂාව අතර වෙනස්කම් 3ක් විස්තර කරන්න.

3. ප්‍රවෘත්ති වාර්තාකරණයේදී ගුවන් විදුලිය, පුවත්පත්,රූපවාහිනී මාධ්‍යයන්හි භාෂා භාවිතයේදී ඔබ මුහුණදෙන වාසි - අවාසි විස්තර කරන්න.

4. සම්මත භාෂාව,උපභාෂාව,භෂා උපාර්ජනය ගැන කෙටි විස්තර සපයන්න

05. 1. බ්‍රිතාන්‍යය හා ඉන්දියානු මහජන සම්බන්ධතා නිර්වචන දෙක ඉදිරිපත් කරන්න.

2. නිවෙස තුළ 'මහජනයා' හඳුන්වා දෙමින් නිවාසය තුල ප්‍රසන්න හැඟීමක් ඇති කරලීම සඳහා ඔබ ගන්නා විධි ක්‍රම තුනක් විස්තර කරන්න.

3. මහජන සම්බන්ධතා ව්‍යාපෘතිය ක්‍රියාවලියේ දී, යොදාගනු ලබන

I තත්තව විශ්ලේෂණය,

II උපාය මාර්ග

III පුද්ගල ප්‍රතිරූපය

කෙටියෙන් විස්තර කරන්න.

4. ඔබ X නැමැති කිරිපිටි වර්ගය, නිෂ්පාදනය කරන සමාගමේ මහජන සම්බන්ධතා නිලධාරියා යයි සිතන්න. කළමනාකාරිත්වයේ අදක්ෂතාවයක් නිසා සමාගමේ සේවක පිරිස අතරත්, පාරිභෝගිකයින් අතරත් සමාගමේ කටයුතු ගැන කලකිරී ඇති අවධියක ඒ තත්වය මඟ හරවා ගැනීමට ඔබ ගන්නා ක්‍රියාමාර්ග 4ක් දක්වා ඉන් 2 ක් විස්තර කරන්න.

06. 1. ජාතික සංවර්ධනය සහ සංවර්ධනය අතර ඇති සම්බන්ධතාවය පිළිබඳ විල්බර් ශ්‍රාම් මහාචාර්යතුමා ඉදිරිපත් කර ඇති කරුණු 4ක් සඳහන් කරන්න.

2. මාධ්‍ය සාක්ෂරතාවයෙහි අවශ්‍යතාව පිළිබඳ කරුණු 2ක් දක්වා ඒවා පැහැදිලි කරන්න.

3. මාධ්‍ය අධ්‍යාපනයෙහි ඇති වැදගත්කම පෙන්නුම් කරන කරුණු හතරක් දක්වා ඒ එක් එක් කරුණු පිළිබඳ විස්තර කරන්න.

4. මාධ්‍ය විචාරයේ ඇති වැදගත්කම යන මැයෙන් පුවත්පතකට ලිපියක් ඉදිරිපත් කරන්න.